15

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන වසර පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 අගෝස්තු / සැප්තැම්බර්

ආර්ථික විද්‍යාව

**ECON 4121.03** - සංවර්ධන ප්‍රතිපත්ති සහ සැළසුම්කරණය

---

කාලය පැය තුන (03)යි.

පළමු කොටසින් ප්‍රශ්න තුනක් (03) ද දෙවන කොටසින් ප්‍රශ්න දෙකක් (02) ද තෝරාගෙන ප්‍රශ්න පහක(05)ට පමණක් පිළිතුරු සපයන්න. පැහැදිලි අත්අකුරු පිළිබඳ සැලකිලිමත්වන්න.

---

## පළමු කොටස

1. අ) අඩු දියුණු රටවල යටත්විජිතකරණයේ අත්දැකීම් එම රටවල කෘෂිකාර්මික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බලපෑ ආකාරය පහදන්න.

(ලකුණු 08)

ආ) යටත්විජිත ආර්ථික ප්‍රතිපත්ති සඳහා එල්ලවන ප්‍රධාන විවේචනයන් මොනවාද? විභාග කරන්න.

(ලකුණු 08)

2. අපනයන ප්‍රවර්ධන ආර්ථික ප්‍රතිපත්ති ආනයන ආදේශන කාර්මිකකරණ ප්‍රතිපත්තිවලට වඩා අඩු දියුණු රටවල් සංවර්ධනය සම්බන්ධයෙන් ඵලදායක වේ. එකඟ වන්නේ ද? විවරණය කරන්න.

(ලකුණු 16)

3. අ) රටක සංවර්ධනය උදෙසා කෘෂිකාර්මික අංශයේ සිදුවියයුතු වෙනස්කම් සම්බන්ධයෙන් දායක වී ඇති ආර්ථික න්‍යායයන් අගයන්න.

(ලකුණු 08)

ආ) කෘෂිකාර්මික ප්‍රතිපත්ති වෙනුවෙන් රජයකට ගතහැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග විවේචනාත්මකව විස්තර කරන්න.

(ලකුණු 08)

4. ''පරිසරය කළමනාකරණය කරමින් සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා රජයකට මැදිහත් විය හැකිය'' පරිසර කළමනාකරණ ප්‍රතිපත්ති ඇසුරින් මෙම ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 16)

දෙවන කොටස

5. ආර්ථික සැලසුම්කරණ ක්‍රම මොනවාදැයි හඳුන්වමින් එකිනෙක සැලසුම්කරණ ක්‍රම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 16)

6. අ) සැලසුම්කරණයෙහි අරමුණක් වශයෙන් සේවා නියුක්තිය ඉහළ නැංවීම මගින් අපේක්ෂා කරන්නේ කුමක්ද? පහදන්න.

(ලකුණු 05)

ආ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සැලසුම්කරණයෙහි අරමුණු හා ඒ සඳහා අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විවේචනාත්මක සංවාදයක යෙදෙන්න.

(ලකුණු 11)

7. චීන ආර්ථික සංවර්ධනයෙහි විකාශනයට අනුව චීනය ලබාගෙන ඇති ප්‍රගතිය සහා ඒ සඳහා වූ උපායමාර්ග පිළිබඳව ඇගයීමක යෙදෙන්න.

(ලකුණු 16)

**************